මගේ අංකය : JSC/SEC/CIR/2022

**සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,**

**<u>ඩී.එන්.ඒ. (DNA) විශ්ලේෂණය සම්බන්ධ වාර්තා නිකුත් කිරීම</u>**

ශීර්ෂගත කරුණට අදාලව ආණ්ඩුවේ රස පරීක්ෂක - ජී.රාමනා මහත්මිය විසින් ලේකම්, අධිකරණ අමාත්‍යාංශය මගින් මා වෙත යොමුකර ඇති 2022.01.20 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපියෙහි සඳහන් කරුණු ඔබගේ අවධානයට යොමු කරන ලෙස මට නියම කර ඇත.

02. අදාල ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 පෙබරවාරි මස 15 වන දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

# ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
## அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
## GOVERNMENT ANALYST'S DEPARTMENT

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுறு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
*E-mail* : govanalyst@sltnet.lk


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022.01.20

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය මඟින්,
ලේකම්,
අධිකරණ සේවා කොමිසම,
අධිකරණ සංකීර්ණය,
කොළඹ 01.

**<u>ඩී.එන්.ඒ. (DNA) විශ්ලේෂණය සම්බන්ධ වාර්තා නිකුත් කිරීම.</u>**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ. (Forensic Serology and DNA) විශ්ලේෂණ අංශය වෙත මසකට නඩු 150 ක පමණ නඩු භාණ්ඩ ලෙස ලැබෙන අතර මසකට වාර්තා 200ක් පමණ ගරු අධිකරණය හා අදාල ආයතන වෙත නිකුත් කරනු ලබයි. මෙම පරීක්ෂණ සඳහා භාවිතා කරනු ලබන විශේෂිත රසායනික ද්‍රව්‍ය සියල්ලම විදේශ රටවලින් මෙරටට ආනයනය කල යුතු වේ. එහෙත් එම රසායන ද්‍රව්‍ය නියමිත පරිදි අදාල රසායනාගාරය වෙත ලබා දීමට එම රසායන ද්‍රව්‍ය සැපයුම් ආයතන වලට නොහැකි වන බව දන්වා තිබේ.

2. මේ සඳහා බලපානු ලබන ප්‍රධානතම හේතුව ලෙස ඩී.එන්.ඒ. විශ්ලේෂණය සඳහා ඉතා වැදගත් රසායන ද්‍රව්‍ය ගෙන්වීම සඳහා විදේශ මුදල් හුවමාරුව අපහසු වීම හා කොරෝනා තත්වය තුල අත්‍යාවශ්‍ය රසායන ද්‍රව්‍යය නිශ්පාදනය ලෝකයේ අදාල රටවල අඩාල වීම බව එම ආයතන දන්වා සිටියි.

3. මෙම විශේෂිත රසායනික ද්‍රව්‍ය සඳහා ප්‍රතිතකරණ සහතිකය (Accreditation Certification) ලබාගෙන ඇති අතර පවත්නා ඩී.එන්.ඒ. විශ්ලේෂණ විද්‍යාත්මක උපකරණ වල භාවිතය සඳහා ඉහත රසායනික ද්‍රව්‍යය අත්‍යාවශ්‍ය වන බව ද සඳහන් කල යුතු වේ.

4. කරුණු මෙසේ වන හෙයින්, මෙම අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ. විශ්ලේෂණ අංශය මඟින් අදාල වාර්තා නිකුත් කිරීමේ කාලය ප්‍රමාද වන බව කණගාටුවෙන් වුවද දන්වා සිටිමි.
තවද අදාල විශේෂිත රසායන ද්‍රව්‍ය සාමාන්‍ය පරිදි ලබා ගත හැකි වූ පසුව නැවතත් නියමිත පරිදි වාර්තා නිකුත් කිරීම කල හැකි වන බව කාරුණිකව දන්වා සිටිමි.

.........................

ජී. රාමනා,
රජයේ රස පරීක්ෂක.

පිටපත්:- නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

පොලිස්පති,
පොලිස් දෙපාර්තමේන්තුව,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.